036

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් - ESU3231

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.06 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

01. "සෞන්දර්ය හැමවිටම රසය ජනනය කරයි."
මෙම පාඨය නිර්වචන දෙකක් ඇසුරින් අර්ථ දක්වන්න.

02. "සෞන්දර්ය කලාව විටෙක පොදු කලාවකි. තවත් විටෙක කේවල කලාවකි." යන්න උදාහරණයක් දක්වමින් විස්තර කරන්න.

03. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදුකිරීමෙන් ශිෂ්‍යයාගේ ආවේදනික ක්ෂේත්‍රය සංවර්ධනය වන ආකාරය පැහැදිලි කරන්න.

04. සෞන්දර්ය කලාව ඉගෙන ගැනීමෙන් ශිෂ්‍යයකු ලබන සුවිශේෂී ප්‍රතිලාභ පහක් (05) දක්වන්න.

05. කතන්දර ගෙතීමේ කලාව ශිෂ්‍යයන්ගේ පරිකල්පන හැකියාව සංවර්ධනයට හේතු වේ. සාධක පහක් (05) දක්වන්න.

06. ප්‍රාථමික ශ්‍රේණිවල ශිෂ්‍යයන්ගේ චිත්‍ර සහ නිර්මාණ ඇගයීමේ දී ගුරුවරයකු ලෙස ඔබ විසින් අවධානය යොමු කළයුතු අංශ පහක් (05) නම් කරන්න.

07. ශිෂ්‍යයන්ගේ අධිප්‍රජානන මානසික කුසලතා සංවර්ධනය කිරීම සඳහා සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යොදාගත හැකි ආකාර කෙටියෙන් විස්තර කරන්න.

08. නව යෞවනවියේ දරුවන් සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා යොදවා ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) භාවමය බුද්ධිය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 05)

(ii) භාවමය බුද්ධියේ විශේෂ ලක්ෂණ **පහක් (05)** දක්වන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍යයන්ගේ භාවමය බුද්ධිය සංවර්ධනය සඳහා සෞන්දර්ය අධ්‍යාපනය දායක කරගන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) සෞන්දර්ය අධ්‍යාපනයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත පරමාර්ථ හා අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) නාට්‍ය හා රංගකලාව විෂය උගන්වන ගුරුවරයෙක් ලෙස සෙසු සෞන්දර්ය විෂයන් දැන ගැනීමේ වැදගත්කම කරුණු **පහක් (05)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

11. (i) බහුවිධ බුද්ධි න්‍යාය අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii) බහුවිධ බුද්ධි න්‍යායේ බුද්ධි වර්ග අට **(08)** නම් කරන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයෙකුට පංති කාමරය තුළදී බහුවිධ බුද්ධි න්‍යාය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම්, ඔබ කැමති බුද්ධි වර්ග දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) ළමා චිත්‍ර වැඩිහිටි චිත්‍රවලින් වෙනස්වන ආකාරය නිදර්ශන මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමා චිත්‍ර ප්‍රධාන සංවර්ධන අවධීන් අනුව වර්ගකොට විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යොදා ගැනීමේ දී ගුරුවරයකු වශයෙන් ඔබ අවධානය යොමු කළයුතු කරුණු **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 10)

(ii) "පූර්ණ පෞරුෂ සංවර්ධනයක් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව විමසන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.